සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2020** — **11 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2020** — **தரம் 11**
**Third Term Test 2020** — **Grade 11**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය I**
**முயற்சியாண்மைக் கல்வி I**
**Entrepreneurship Studies I**

**පැය දෙකයි**
**இரண்டு மணித்தியாலம்**
***Two hours***

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය කර විශ්‍රාම ගත් නන්දන මහතා තමන්ගේම කියා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කලේය. වර්තමානයේ රාජ්‍ය ප්‍රතිපත්තියක් ව පවතින කාබනික පොහොර භාවිතය යෝග්‍ය ව්‍යාපාර අවස්ථාව ලෙස තෝරා ගත් නන්දන මහතා තමන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයෙන් ලද දැනුමද උපයෝගී කර ගනිමින් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කලේය. වෙනස් වන පරිසරයට අනුගත වීමට කැමති, අවදානම් බාරගැනීමට මැලි නොවූ නිර්මාණශීලී පුද්ගලයෙක් වූ නන්දන මහතා රු. 500,000 වටිනා සිය ඉඩම ද, රු. 200,000 වටිනා ගොඩනැගිල්ල ද, රැකියාවෙන් ලද ආදායමෙන් ඉතිරිකරගත් රු. 200,000 ද, රු. 50,000 වටිනා උපකරණ ද , ව්‍යාපාරය සඳහා යෙදවීමට තීරණය කළේය. මීට අමතරව වෙළඳපොල සමීක්ෂණය සඳහා රු. 6,000ක් ද, ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා රු. 3,500 ක් ද, ව්‍යාපාර සැලැස්ම සැකසීම සඳහා රු. 10,000ක් ද, ව්‍යාපාර ආරම්භ කිරීමේ සමාරම්භක උත්සවය සඳහා රු. 15,000ක් ද, දෛනික මුදල් අවශ්‍යතා සඳහා රු. 60,000ක් ලඟ තබා ගැනීමට ද, තීරණය කර ඇත. නන්දන මහතාගේ සිද්ධිය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) නන්දන මහතාගේ ව්‍යාපාරයේ ශක්තීන් හා අවස්ථා සඳහා එක් උදාහරණය බැගින් සඳහන් කරන්න.
(ii) නන්දන මහතා විසින් හඳුන්වා දීමට අපේක්ෂිත නිෂ්පාදිතය සඳහන් කරන්න.
(iii) නන්දන මහතා ළඟ දැකිය හැකි ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(iv) මෙම ව්‍යාපාරය කවර ව්‍යාපාර සංවිධාන විශේෂයකට අයත් වන්නේ ද?
(v) එම ව්‍යාපාර සංවිධාන විශේෂයේ ඇති වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න.
(vi) මෙම ව්‍යාපාරයෙන් දේශීය ආර්ථිකයට අත්විය හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.
(vii) මොහුගේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන මුළු කාරක ප්‍රාග්ධනය ගණනය කර දක්වන්න.
(viii) මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරීමට අපේක්ෂිත මුදල කොපමණ ද?
(ix) නන්දන මහතා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල කොපමණ ද?
(x) මෙම ව්‍යාපාරය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුළු මුදල කොපමණ ද? (ල. 20)

02) (i) ව්‍යවසායකත්වය යනු කුමක්දැයි ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.
(ii) පුද්ගලයකු තුළ නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනිමට උපකාරී වන සාධක 04ක් දක්වන්න.
(iii) නවෝත්පාදන එළි දැක්වෙන මූලාශ්‍ර 02ක් උදාහරණ සහිතව දක්වන්න.
(iv) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට ලැබෙන ප්‍රයෝජන 04 ක් දක්වන්න.
(v) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වන නිෂ්පාදන සාධක 4 නම් කරන්න. (ල. 10)

03) (i) කුඩා පරිමාණ ව්‍යාපාරයක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(iii) කුඩා ව්‍යාපාර ඉක්මනින් අසාර්ථක වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න.
(iv) ව්‍යවසායකයකු විසින් වර්ධනය කර ගත යුතු මූලික කුසලතා දෙකක් සඳහන් කරන්න.
(v) ව්‍යාපාර අවධානම යනු කුමක්දැයි කෙටියෙන් සඳහන් කරන්න. (ල. 10)

04) (i) නව ව්‍යවසායකයකුට වෙළඳපොලට පිවිසිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර අවස්ථාවක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) ව්‍යවසායකයෙකුට ව්‍යාපාර අදහස් පහළ විය හැකි මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න.
(iv) සාර්ව විශ්ලේෂණය යන්න කෙටියෙන් සඳහන් කරන්න.
(v) හොඳ ව්‍යාපාර අවස්ථාවක දැකිය හැකි ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ල. 10)

05) (i) ව්‍යාපාර සැලැස්ම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) විධායක සාරාංශයක ඇතුලත් තොරතුරු හතරක් සඳහන් කරන්න.
(iii) ව්‍යාපාරයකට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
(iv) මූල්‍ය සැලැස්මක අන්තර්ගත කොටස් දෙකක් සඳහන් කරන්න.
(v) යෝජිත ව්‍යාපාරයක අලෙවිකරණ උපාය මාර්ග (4P's) නම් කරන්න. (ල. 10)

06) (i) හවුල් ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
(ii) සංස්ථාපිත සමාගමක 'ප්‍රාග්ධනය සපයා ගැනීම හා වගකීම' පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) ව්‍යාපාර සංවිධානයක පොදුවේ දැකිය හැකි ලක්‍ෂණ හතරක් නම් කරන්න.
(iv) ව්‍යාපාරයක් සමාජ වගකීම් ඉටුකිරීමෙන් ව්‍යාපාරයට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.
(v) ව්‍යාපාර ආයතනයක පවතින නිෂ්පාදන ස්ථාවර වත්කම් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ල. 10)

07) ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් ආරම්භ කිරීමට අපේක්ෂිත මහේලගේ ව්‍යාපාරයේ 2019 වර්ෂය සඳහා සකසන ලද ව්‍යාපාර සැලැස්මෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ව්‍යාපාරය සඳහා යෙදවූ මුදල | රු. 250, 000 |
| ලිපිද්‍රව්‍ය තොග ලබා ගැනීමට | රු. 60, 000 |
| දුරකථන බිල් ගෙවීමට | රු. 10, 000 |
| ගොඩනැගිලි කුලිය ගෙවීමට | රු. 25, 000 |
| ලීබඩු උපකරණ ගැනීමට | රු. 50, 000 |
| කාර්යාලයට අල්මාරියක් ගැනීමට | රු. 15, 000 |
| ජල ගාස්තු ගෙවීමට | රු. 2, 000 |
| අපේක්ෂිත අලෙවි ආදායම | රු. 400, 000 |
| බැංකු ණය ගැනීම | රු. 100, 000 |
| විදුලි බිල සඳහා | රු. 15, 000 |
| ණයගැති ලැබීම් | රු. 22, 000 |
| සේවක වැටුප් ගෙවීම් | රු. 120, 000 |
| මෙහෙයුම් පෙර වියදම් | රු. 20, 000 |
| ණය පොළිය ගෙවීමට | රු. 25, 000 |
| ණය හිමියන්ට ගෙවීම් | රු. 30, 000 |

ඉහත සඳහන් තොරතුරු ඇසුරින් මහේලගේ ව්‍යාපාරයේ 2019 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්න.